# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 158/2 — 1975 අප්‍රේල් 07 වැනි සඳුද — 1975.04.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලැබේ)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

#### මුදල් නීති පනත

මුදල් නීති පනතේ (422 අධිකාරය) 10 (ඇ), 93, 94, 96 සහ 97 වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවන ලද රෙගුලාසිය.

එච්. ඒ. තෙන්නකෝන්,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

1975 අප්‍රේල් 07 වැනි දින,
කොළඹ දී ය.

රෙගුලාසිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සකස් කොට, 1950 අගෝස්තු 28 වැනි දින අංක 10,143 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද හා වරින් වර සංශෝධනය කරන ලද (ඇ) රෙගුලාසිය 1975 අප්‍රේල් 21 වැනි දින සිට බල පවත්නා පරිදි, පහත සඳහන් අයුරු මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) 1 වැනි ඡේදයේ (2) (අ) උප ඡේදයේ සඳහන් " හෝ එවැනි බැංකුවක් විසින් සිය වත්කම් වශයෙන් ඉන් කොටසක් මහ බැංකුවේ රුපියල් තැන්පතු වශයෙන් සහ කොටසක් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි වශයෙන් දරන " යන වචන ලොප් කිරීම ;

(2) 1 වැනි ඡේදයේ (2) (ආ) උප ඡේදය ලොප් කිරීම.

4—314/1

---

#### මුදල් නීති පනත

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනතේ (422 අධිකාරය) 10 (ඇ), 93, 94, 95, 96 සහ 97 වගන්ති යටතේ ක්‍රියා කරමින්, වහාම බලපවත්වන පරිදි පහත සඳහන් දෑ මෙයින් අවලංගු කරනු ලැබේ :—

(1) මණ්ඩලය විසින් සකස් කොට, 1961 පෙබරවාරි 1 වැනි දින අංක 12,280 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද ' උ ' රෙගුලාසිය ; හා

(2) මණ්ඩලය විසින් සකස් කොට, 1965 ජූනි 9 වැනි දින අංක 14,420 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ' ඌ ' රෙගුලාසිය.

එච්. ඒ. තෙන්නකෝන්,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

1975 අප්‍රේල් 07 වැනි දින,
කොළඹ දී ය.

4—314/2

244/3—එ13638—4,285(75/4)

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 1975 මාර්තු මස 31 වැනි දිනට සාමාන්‍ය ශේෂ පත්‍රය

**වගකීම්**

| 1975 පෙබරවාරි මස 28 දින | | | 1975 මාර්තු මස 31 දින | |
|---|---|---|---|---|
| රු. | රු. | **ප්‍රාග්ධන ගිණුම්** | රු. | රු. |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය ... ... ... | 1,50,00,000 | |
| 6,10,00,000 | | අතිරික්තය ... ... ... | 6,10,00,000 | |
| | 7,60,00,000 | | | 7,60,00,000 |
| | | **වගකීම්** | | |
| 1,66,20,75,481 | | සංසරණයෙහි පවත්නා නෝට්ටු... ... | 1,72,63,86,953 | |
| 9,95,64,859 | | සංසරණයෙහි පවත්නා කාසි ... ... | 10,01,49,730 | |
| | 1,76,16,40,340 | | | 1,82,65,36,683 |
| | | **තැන්පතු** | | |
| 13,47,05,804 | | රජය ... ... ... | 12,99,93,223 | |
| 36,12,207 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන ... ... | 55,78,560 | |
| 37,60,01,282 | | වෙළෙඳ බැංකු ... ... ... | 38,31,94,975 | |
| 65,83,89,420 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන ... ... | 7219,91,866 | |
| 73,738 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 12,15,93,230 හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල | 95,418 | |
| 2,77,92,103 | | අනෙකුත් ... ... ... | 2,76,17,073 | |
| | 1,20,05,74,554 | | | 1,26,84,76,115 |
| | 42,36,07,269 | විදේශීය ණය ගැනීම් ... ... ... | | 55,23,19,444 |
| | 7,51,28,288 | මධ්‍යම හා දීර්ඝ කාලීන ණය අරමුදල ... ... | | 7,51,28,288 |
| | 2,00,03,89,243 | අනෙකුත් වගකීම් හා ගිණුම් ... .... ... | | 1,98,95,71,974 |
| | 5,53,73,39,694 | | | 5,78,80,32,504 |

**වත්කම්**

| 1975 පෙබරවාරි මස 28 දින | | | 1975 මාර්තු මස 31 දින | |
|---|---|---|---|---|
| රු. | රු. | **ජාත්‍යන්තර සංචිතය** | රු. | රු. |
| 36,61,75,514 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් ... | 41,95,85,322 | |
| 11,33,78,143 | | *විදේශීය රාජ්‍ය සුරැකුම්පත් ... ... | 11,42,96,924 | |
| 11,75,26,797 | | විශේෂ ආපසු ගැනීම් හිමිකම්පත් ... ... | 10,94,17,633 | |
| | 59,70,80,454 | | | 64,32,99,879 |
| | | **දේශීය වත්කම්** | | |
| | | ණය සහ අත්තිකාරම්— | | |
| 43,22,88,585 | | †රජයට ... ... ... | 56,21,88,585 | |
| 4,67,63,620 | | අනෙකුත් අයට—මධ්‍යම හා දීර්ඝ කාලීන ... | 4,50,84,670 | |
| 76,42,00,000 | | —කෙටි කාලීන ... | 88,16,50,000 | |
| 2,10,23,47,472 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් ... | 2,03,13,04,816 | |
| | 3,34,55,99,677 | | | 3,52,02,28,071 |
| | 1,59,46,59,563 | අනෙකුත් වත්කම් හා ගිණුම් ... ... ... | | 1,62,45,04,554 |
| | 5,53,73,39,694 | | | 5,78,80,32,504 |

*1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 71,89,972 ක ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 7,10,163 ක වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 41,11,021 ක් සහ රු. 5,36,503 ක් විය.

†ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන්ට ශ්‍රී ලංකාවේ දායක මුදල් වශයෙන් ගෙවීම සඳහා වූ රු. 9,84,88,585 ක විශේෂ ණයද ඇතුළත් වෙයි.

එච්. ඒ. තෙන්නකෝන්,
අධිපති.

ඒ. බණ්ඩාරනායක,
ප්‍රධාන ගණකාධිකාරී.

ඉහත සඳහන් ශේෂ පත්‍රය මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යන පොත් හා වාර්තා අනුව ශේෂ පත්‍රය යථා පරිදි සකස් කර ඇති බව මගේ අදහස වෙයි.

1975 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දිය.

ඩී. එම්. ඩබ්ලිව්. විජයසූරිය,
විගණකාධිපති.

3-312

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී